Journal of Intangible Cultural Heritage

JICH (2024), Volume 3, Issue I

# The Utility of Swords in Kandyan and Low- country Rituals

## උඩරට හා පහතරට ශාන්තිකර්මයන්හි කඩුවෙහි උපයෝගීතාව පිළිබඳ අධ්‍යයනයක්

A.A. M. M. M. Amarathunga[1] and W. V. P. H. Ranaweera[1,2*]

[1]Department of Languages, Cultural Studies and Performing Arts, [2]International Center for Multidisciplinary Research, University of Sri Jayewardenepura, Sri Lanka
*himalika@sjp.ac.lk


## *Abstract*

*The sword, a distinctive weapon used in various countries, holds multiple utilities across cultures. Among them, rituals featuring swords are commonly found. Sword usage is also seen in folk rituals in Sri Lanka, which hold an important place in society. The main objective of this research was to explore how the sword, a destructive weapon with sharp edges, is integrated into local dance rituals in Sri Lanka. Accordingly, the ritualistic offerings and performances involving the sword, the utility, and the purpose of sword usage in folk rituals were examined. The research problem was whether the original intent and the functions of the sword are represented when it is employed as a ritualistic artifact or theatrical prop in rituals. Since the study followed an ethnographic research approach, it relied on field research in identifying the exact perspectives of the community regarding the usage of swords in rituals. Additionally, secondary sources located via library surveys were used to gain further insights to provide a nuanced analysis. Using Kandyan and Low-country traditions as the limitations of the study, direct and indirect observations of targeted rituals were done, and interviews were conducted with expert artisans. The data analysis revealed that in folk rituals, the sword serves multiple roles, i.e., as an ornament of deities; a ritualistic artifact; and theatrical prop. Moreover, evoking heroic sentiment and blessings are some of the purposes of using swords. However, some characters that enact devils also wield swords. It was also revealed that the use of the sword in the Kandyan tradition is relatively minimal compared to the low country tradition. This is because the prevalence of characters enacting gods and devils is high in Low country dance rituals. With the exceptions of ritual performances like Kadupaliya and Wina Kepeema, swords are not commonly used for sacrificial purposes. In conclusion, the use of swords in local dance rituals serves psychotherapeutic purposes in different ways and demonstrates its primary application in unique manners by symbolizing the original weapon.*


***Key Words:*** *Weapons, Ornaments of gods, Ritualistic Artifact, Theatrical Props, Kadupaliya*

## 1. හැඳින්වීම

මානව පරිණාමය ආරම්භයෙහි පටන් ආදි මානවයා නොයෙකුත් අවශ්‍යතා වෙනුවෙන් විවිධාකාර ආයුධ භාවිත කළ බවට සාධක හමු වී ඇත. ආත්මාරක්ෂාව යනු මානවයා ආයුධ භාවිතයට පෙළඹුණු එක් අවශ්‍යතාවකි. මානව පරිණාමයත් සමග එම ආයුධ නිර්මාණයත්, භාවිතයත් විකාශනය වෙමින් වඩාත් සංවිධිත තත්ත්වයට පත් විය. ලොව සෑම රටක ම ජන සමාජයක ම ජනප්‍රිය ආයුධ විශේෂයක් ලෙස කඩුව ප්‍රමුඛත්වයට පත් ව ඇත. මෙය "Sword" යන ඉංග්‍රීසි නාමයෙන් හඳුන්වයි. ''මණ්ඩලග්ගෝ, නෙත්තිංසෝ, අසී, ඛග්ගෝ, සායකෝ'' යන සංස්කෘත නාමයන්ගෙන් ද (කුලතුංග, 2000) ''ත්සරු''යන සංස්කෘත වචනයෙන් සිංහලයට බිඳී ආ ''ථරු'' යන වචනයෙන් ද කඩුව හැඳින්වේ. එමෙන් ම ''අසිපත, කස්තාන'' වැනි නාමයන් ද (හේරත්, 2020) කඩුවට සමරුත් ලෙස ව්‍යවහාරයේ පවතී.

පොලොන්නරු යුගයේ රචිත අභිධානප්පදීපිකාවේ දැක්වෙන මුත්තාමුත්ත (මුත්තාමුත්ත), අමුත්ත (අතේ තබාගෙන පමණක් පහරදිය හැකි ආයුධ), පාණිමුත්ත (අතින් මුදාහරින ආයුධ) හා යන්තමුත්ත (උපකරණයක් මඟින් මුදාහරින ආයුධ) යන ආයුධ වර්ග අතුරින් (උදෘතය කුලතුංග, 2000) අමුත්ත යන ගණයට කඩුව ගැනේ. යුද්ධයේ සංකේතය වශයෙන් සැලකෙන කඩුව මුහුණට මුහුණලා සිදු වන සටන්වල දී භාවිත කළ ප්‍රධානතම ආයුධය විය (කුලතුංග, 1998). කඩු නිෂ්පාදන තාක්ෂණය ජ්‍යොතිෂ්‍ය විද්‍යාව සමග බද්ධ වූ බැවින් එය භාවිත කරන පුද්ගලයාට අනුව විශේෂිත වේ (විමලානන්ද, 1962). භාවිත කරන්නා අනුව ගණ පිහිටුවා නිෂ්පාදනය කරන කඩුව අදාළ පුද්ගලයාගේ වියතෙහි සහ ඇඟිලිවල දිග අනුව අනන්‍ය වන ආකාරයට නිෂ්පාදනය කරනු ලබයි. එසේ ම කඩුවක් පණ පෙවීම ද විශේෂිත කාර්යයක් වන අතර රජුගේ කඩුව ගිතෙලෙන් ද රණ ශූරයාගේ කඩුව රුධිරයෙන් ද සාමාන්‍ය කඩුව කිරිවලින් ද බහා පණ පෙවීම සිදු කර ඇත (ජයතිස්ස, 2011). කඩුවල හැඩය පිළිබඳ සැලකීමේ දී දික්කඩු, ලුහුඬු කඩු, දිලෙන කඩු, ලෙලෙන කඩු, වක් කඩු, කස්තාන කඩු ආදී වශයෙන් විවිධ නම්වලින් හඳුන්වන ලද කඩු පැවති අතර කඩු වටිනාකම දක්වනු පිණිස ප්‍රභූන් විසින් යොදාගන්නා ලද කඩු රන් කඩු, රිදී කඩු, මිණි කඩු, සත්රුවන් කඩු, ආදී නම්වලින් ද හඳුන්වා ඇත (කුලතුංග, 1988).

රාජාභිෂේකයේ දී හා රාජ්‍ය උත්සවවල ගෞරව පිරිනැමීමේ දී ප්‍රදාන කරන තිළිණ ලෙසත් රාජ කකුධ භාණ්ඩයන්ගෙන් එක් අංගයක් ලෙසත් කඩුව භාවිතයට ගැනේ. අනුරාධපුර රාජධානි සමයෙහි රජතුමාගේ කඩුව භාර තැනැත්තා ''අසිග්ගාහක'' යන නාමයෙන් හෝ තනතුරෙන් හඳුන්වා තිබේ(හේරත්, 2020). එමෙන් ම රාජ කුමාරවරුන්ගේ හා කුල දරුවන්ගේ ශිල්ප ක්‍රමයක් වශයෙන් ද අංගම් සටන් කලාවේ ඉලංගම් ශිල්ප ක්‍රමයක් වශයෙන් ද කඩු ශිල්පය ප්‍රධාන වී තිබේ (උදයංගනී, 2020).

සතුරාට පහර දීමට හෝ ආත්මාරක්ෂාව කඩුවෙහි ප්‍රමුඛ උපයෝගීතාවකි. එමගින් බලය, අධිකාරිත්වය, ධෛර්යය, වීරත්වයක් හෝ තේජාන්විත බවක් පෙන්නුම් කෙරේ. එකී පරමාර්ථ පෙරදැරි ව ධජ හෝ නිල ලාංඡන සඳහා ද කඩුව සංකේතාත්මක ව යොදා ගනී. විශේෂයෙන් ම පුරාණ වීරවරයින්, රජවරුන්, රණශූරයින් මෙන් ම ආගමික සංකල්ප නියෝජනය කරන දෙවියන් හෝ යක්ෂයින් අත දරන ආයුධයක් වශයෙන් ද කඩුව බොහෝ සංස්කෘතීන්හි නිරූපණය වේ. විශේෂයෙන් ම කොරියාව වැනි රටවල කඩුව දිව්‍යමය හෝ අතිමානුෂීය ශක්තීන් දැක්වීම සඳහා බහුල ව යෙදේ (Lee, 2012).

කඩුව ආයුධයක් හෝ සංකේතයක් වශයෙන් යොදා ගනු ලබන උක්ත ප්‍රකාශිත තත්ත්වවලින් බැහැර වූ තවත් අවස්ථා ඇත. ඒ අතර නර්තන කලාවට අදාළ ව දේශීය වශයෙන් මෙන් ම විදේශීය වශයෙනුත් සාක්ෂ්‍ය පවතී.

කඩුව මූලික රංග භාණ්ඩය කර ගත් කඩු හරඹ ක්‍රීඩාවෙන් බිඳී ආ ''කඩු නැටුම'' හෙවත් ඉංග්‍රීසි භාෂාවෙන් හඳුන්වන "Sword Dance" යන නර්තනය මෙරට පමණක් නොව

ලෝකයේ බොහෝමයක් රටවල පවතින්නා වූ නර්තනාංගයකි. ලාංකේය නර්තන කලාව තුළ ජන ක්‍රීඩා හා ජන නැටුම් ගණයෙහි ලා මෙම කඩු නැටුම සලකනු ලැබුව ද ඇතැම් රටවල් තුළ රාජ සභා නර්තනාංගයක් වශයෙන් ද මෙය ප්‍රචලිත ය (Malborg & Lee Jean Young, 2005). බොහෝ රටවල ජන නැටුම් ගණයෙහි ලා සලකන මෙකී නර්තනාංගයෙන් විද්‍යමාන වන්නේ රණ ශූරත්වය, වීරත්වය, උත්සාහය, සටන යනාදිය යි.

සතුරාට පහරදීමට සටනෙහි භාවිත කළ මෙම කඩුව ආයුධයක් වශයෙන් නොව එය සංකේතවත් කරන රංග භාණ්ඩයක් ලෙස නර්තන කලාව හා සබැඳේ. කඩු නැටුමක දී සිදු වන්නේ අනුකරණාත්මක රංග විලාසයන් මඟින් සටන් අවස්ථා ප්‍රතිනිර්මාණය කිරීම යි. ලාංකේය කඩු නැටුම්වල දී වීරත්වය පිළිබිඹු වන පරිදි නර්තන චලන නිර්මාණය කෙරේ. කොරියාව කඩු නර්තනයට අතිශය ප්‍රසිද්ධ රාජ්‍යයකි. කොරියානු කඩු නර්තනයෙහි විශේෂත්වය වන්නේ එහි කාන්තාවන් පමණක් නර්තනයෙන් දායක වීම යි.

ශ්‍රී ලංකාවෙහි කඩු නැටුම පෝෂණය වූයේ කඩු හරඹ යන සටන් ක්‍රමය ඔස්සේ ය. මෙම කඩු හරඹය යන්න පුරාණයේ පටන් ලංකාවට අයත් සටන් ශිල්පක්‍රමයකි. ආත්මාරක්ෂාව සඳහා බොහෝ නිවෙස් තුළ කඩුවක් තබා ගැනීම මෑත අතීතය වන තෙක් ම සිදු වූවකි. ශ්‍රී ලංකාවේ පවතින ජන නැටුම් අතුරින් ද කඩු නැටුම සුවිශේෂ වූ ලක්ෂණ ප්‍රතීයමාන කරන නර්තනාංගයකි. එයට හේතුව වන්නේ මෙම කඩු නැටුම ඍජු ලෙස අනෙකුත් ජන නැටුම් මෙන් ජීවන වෘත්තීන් හා සම්බන්ධ වූ ජන නැටුමක් බවට පත් වී නොමැති නිසා ය.

කඩු හරඹය හෙවත් සරඹය යන අංගය ජන ක්‍රීඩා අතුරින් ප්‍රමුඛ වන්නකි. මෙම ක්‍රීඩාව මඟින් පැරණි යුධ ක්‍රම පිළිබිඹු කරන අතර යුද්ධයෙන් ප්‍රතිමල්ලවයන් ජය ගන්නා ආකාරයත් ඔවුන් අභිභවනය කරන ආකාරයත් දැක්වේ. පැරණි යුධ සෙබළුන් ප්‍රතිමල්ලවයන් හා සටන් වැදීමේ දී පවා බෙර පද නාදයට අනුව හරඹ සිදු කර ඇති බව දැක්වේ. මෙම ජන ක්‍රීඩාව සිදු කරන්නේ ද තාලයට හා කවියට අනුකූල ව ය (සෝමරත්න, 1963).

දේශීය නර්තන කලාව හා අත්‍යන්තයෙන් ම බැඳී ඇති ශාන්තිකර්ම දේශීය ජන නැටුම් රාශියක මුල් බිම යි. ශාන්තිකර්මයක දී භාවිත කෙරෙන විවිධ රංග භාණ්ඩ හා පූජා භාණ්ඩ අතර කඩුවට ද හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. කඩුවට යක්ෂ භූතයින් පලවා හැරීමේ බලයක් ඇතැයි සිංහල ගැමියෝ විශ්වාස කරති (දිසානායක, 2001). රංග භාණ්ඩයක් ලෙසත් ඇතැම් විටක පූජා භාණ්ඩයක් ලෙසින් දේවාභරණ ගණයටත් කඩුව අභිචාරකර්මයන්හි දී යෙදේ. යක්ෂයන් හෝ දෙවියන් නිරූපණය කරන ආයුධයක් ලෙසින් මෙන් ම හුදු සංකේතාත්මක රංග භාණ්ඩයක් ලෙසින් ද අභිචාරමය පරමාර්ථ පෙරදැරි ව කඩුව ශාන්තිකර්මයන්හි යොදා ගන්නා ගනී. එය ජන නැටුමක දී හෝ ජන ක්‍රීඩාවක දී කෙරෙන විනෝදාර්ථ අභිලාසයට වඩා පුළුල් වූවකි. කඩුව රංග භාණ්ඩයක් ලෙස යොදා ගනිමින් සිදු කරන ජන ක්‍රීඩාවක දී මෙන් ම ජන නර්තනයේ දී සටන් අවස්ථා අනුකරණය කර දැක්වීම මූලික පරමාර්ථය වේ. එහෙත් ශාන්තිකර්මයන්හි කඩුව යොදා ගැනීමේ අවශ්‍යතාව ඊට වඩා පුළුල් වපසරියක පැතිරුණකි.

රංග භාණ්ඩයක් හෝ පූජා භාණ්ඩයක් ලෙස ශාන්තිකර්මයන්හි කඩුව භාවිත කිරීමේ දී කඩුව නම් ආයුධයට අදාළ මූලික භාවිතාර්ථ හා ස්වරූප ශාන්තිකර්මයන්හි නිරූපණය වන්නේ ද යන්න මෙම පර්යේෂණයෙහි ගැටලුව විය. තියුණු මුවහතක් සහිත ඉතා විනාශකාරී ආයුධයක් වූ කඩුව දේශීය ශාන්තිකර්ම හා බැඳී පවතින ආකාරය අධ්‍යයනය කිරීම මූලික අරමුණ කොට ගෙන දේශීය ශාන්තිකර්මයන්හි කඩුව ආශ්‍රිත ව ගොඩනැඟී ඇති පුද පෙළපාළි සහ නර්තනාංග හඳුනාගැනීම, එහි උපයෝගිතාව, කඩුව භාවිත කිරීමේ අරමුණු හා ස්වභාවය අධ්‍යයනය කිරීම පර්යේෂණයෙන් සිදු විය. එහි දී

සංකල්පාර්ථයෙන් හෝ සංකේතාර්ථයෙන් කඩුව නම් ආයුධය ශාන්තිකර්ම ඇදුරා විසින් භාවිතයට ගන්නා ලද්දේ දැයි විමසුමට ලක් විය.

උක්ත අධ්‍යයන අරමුණු සම්පාදනය කරගනු වස් මූලික වශයෙන් සාහිත්‍යයික මූලාශ්‍රය අධ්‍යයනය සිදු කරන ලදී. දේශීය ශාන්තිකර්ම ක්ෂේත්‍රය අළලා සම්පාදිත පර්යේෂණාත්මක කෘති හා වෙනත් ලේඛන රාශියකි. එහෙත් ඒවායෙහි භාවිත කෙරෙන රංග භාණ්ඩ හෝ පූජා භාණ්ඩයන්හි උපයෝගීතාව අලළා සම්පාදිත ලේඛන ඉතා අල්ප ය.

උඩරට හා පහතරට නර්තන සම්ප්‍රදායයන්හි කඩුවේ භාවිතය අධ්‍යයනයේ දී *කොහොඹා යක් කංකාරිය හා සමාජය* (දිසානායක, 2016), *ශාන්තිකර්ම හා අභිචාර විධි* (පීරිස්, 2009), *පුරාණ ඇදහීම් සහ ශාන්තිකර්ම* (ආරියදාස, 2018), *පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය* (කෝට්ටේගොඩ, 2013), *මැණික්පාල ශාන්තිය හෙවත් සූනියම් කැපිල්ල* (කෝට්ටේගොඩ, 1998) වැනි කෘති වැදගත් විය. එක් එක් පුද පෙළපාළි සඳහා කඩුව රංග භාණ්ඩයක් හෝ පූජා භාණ්ඩයක් වශයෙන් භාවිත කරන බව ඒවායෙහි සංක්ෂිප්ත ව දක්වා ඇති නමුත් කඩුව හා බැඳි පුද පෙළපාළි සඳහා ම සුවිශේෂ අවධානය යොමු ව නොමැති වීමෙන් අප අධ්‍යයන ගැටලුවට අදාළ ව දත්ත සම්පාදනය කර සාහිත්‍යයික මූලාශ්‍රයන්ගෙන් වැඩි දායකත්වයක් ලබා ගත නොහැකි විය.

ශාන්තිකර්ම භූමිය තුළ කඩු නිර්මාණය කෙරෙන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ලයනල් බෙන්තරගේ විසින් රචිත *පහතරට ශාන්තිකර්මවල වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ (2005)* යන කෘතිය විශේෂ විය. ශාන්තිකර්ම භූමියේ දී ස්වාභාවික අමුද්‍රව්‍ය යොදා ගනිමින් කඩුව නම් රංග භාණ්ඩය නිර්මාණය කරන බවත් කඩුව භාවිතයෙහි වාස්තු විද්‍යාත්මක පැතිකඩත් මෙම කෘතියෙන් ප්‍රකාශිත ය. එහෙත් ශාන්තිකර්ම පුද පෙළපාලි හා සමපාත කරමින් කඩුව භාවිතය පිළිබඳ විග්‍රහ කිරීමක් කතුවරයා විසින් ඉදිරිපත් කර නැත. සමස්තයක් වශයෙන් අතීත මානව සමාජයන්හි කඩුවෙහි භාවිතය හා අභිචාරාර්ථයෙන් කඩුව විවිධ සමාජයන්හි යොදා ගැනීම පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා The Book of the Sword (Burton, 1884), The Sword: The Development of Consciousness (Lee, 2012) වැනි කෘති ද පරිශීලනය කරන ලදී.

ජන නර්තන වර්ගීකරණය යටතේ කඩු නර්තනය පිළිබඳ සිදු කෙරුණු ලේඛන සාහිත්‍යයක් පැවතිය ද එය දේශීය ශාන්තිකර්ම විෂයෙහි භාවිත කිරීම පිළිබඳ වන අධ්‍යයන අඩු බව සාහිත්‍ය විමර්ශන හරහා අනාවරණය විය. එහෙයින් තද් විෂය ක්ෂේත්‍රය පිළිබඳ ව පවත්නා පර්යේෂණ හිඩැස හඳුනාගනිමින් ක්ෂේත්‍ර අධ්‍යයන කෙරේ වැඩි නම්‍යතාවකින් යුතු ව මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ලේඛනගත නොවූ ජනශ්‍රැතිකාංගයක නිවැරදි භාවිතය පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදු කිරීමට එමඟින් හැකියාව ලැබිණි.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

කිසියම් සංස්කෘතියකට අයත් ප්‍රජාවගේ චර්යා හා සිතුම්-පැතුම් ඇතැම් භෞතික වස්තු හරහා ප්‍රකාශ වේ. එම භෞතික වස්තුවලට විවිධ සමාජ ප්‍රපංචයන්හි ලබා දෙන අගයන් විවිධ ය. මෙම පර්යේෂණය ලෝකය පිළිබඳ විෂයමූලවාදී ප්‍රවේශයකින් යුතු ව මානවවංශ පර්යේෂණයක් වශයෙන් සිදු කෙරිණි. පුස්තකාල හා ක්ෂේත්‍ර අධ්‍යයනය හරහා රැස් කර ගන්නා ලද ගුණාත්මක දත්ත තේමාත්මක විශ්ලේෂණයට බඳුන් කරන ලද අතර එහි දී අර්ථ නිරූපණවාදය යොදා ගන්නා ලදී. උද්ගාමී තර්කනයට අනුව අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳ විස්තරාත්මක ව රැස් කරගන්නා ලද දත්ත ඇසුරින් ප්‍රපඤ්චය පිළිබඳ නිගමනයනට එළඹිණි.

මානවවංශ විධි විවරණයක දී මානව ප්‍රජාවගේ දෘෂ්ටියෙන් තත්ත්වාකාරයෙන් දත්ත රැස් කර ගත යුතු හෙයින් ක්ෂේත්‍ර අධ්‍යයනයට ප්‍රමුඛතාව ලබා දෙන ලදී. ඒ යටතේ

ශාන්තිකර්ම නිරීක්ෂණය කිරීම සිදු විය. උඩරට හා පහතරට ශාන්තිකර්මයන්හි කඩුව සංකේතාත්මක ව රංග භාණ්ඩයක්, පූජා භාණ්ඩයක් හෝ දේවාභරණයක් වශයෙන් යොදා ගන්නා අකාරය සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා නිරීක්ෂණ ඇසුරින් ගවේෂණය කෙරිණි. ඒ සඳහා සාම්ප්‍රදායික ශාන්තිකර්ම ශිල්පීන් හා නර්තන ආචාර්යවරුන් සම්බන්ධ කර ගනු ලැබිණි. පුස්තකාල අධ්‍යයනය යටතේ මෙම විෂය ක්ෂේත්‍රයට අදාළ ලිඛිත මූලාශ්‍රය ද පරිශීලනය කෙරුණු අතර දේශීය නර්තන කලාව හා ශාන්තිකර්මයනට සම්බන්ධ කෘති හා ලේඛන අධ්‍යයනය කිරීම සිදු කෙරිණි.

මෙම අධ්‍යයනය මූලික වශයෙන් ශාන්තිකර්ම පදනම් කර ගෙන සිදු කරන්නකි. අධ්‍යයන ක්ෂේත්‍රය වූයේ උඩරට හා පහතරට ශාන්තිකර්ම යි. වර්තමානය වන විට භූගෝලීය සීමා නොතකමින් මෙම සම්ප්‍රදායන් රට පුරා පුළුල් ලෙස ව්‍යාප්ත ව පවතී. ඒ අනුව ඍජු හා වක්‍ර නිරීක්ෂණයත් සම්මුඛ සාකච්ඡා ක්‍රමයත් දත්ත රැස් කිරීමට යොදා ගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා සඳහා උඩරට සාම්ප්‍රදායික ශිල්පීන් 05 දෙනෙකු හා පහතරට ශිල්පීන් 05 දෙනෙකු බැගින් ශාන්තිකර්ම ක්ෂේත්‍රයෙහි ප්‍රවීණ ශිල්පීන් දහදෙනකු (10) විනිශ්චයමය නියැදි ක්‍රමය යටතේ අධ්‍යයනය නියැදියට ඇතුළත් කර ගැනිණි. නිරීක්ෂණ ක්‍රමය යටතේ සජීවී ශාන්තිකර්ම මෙන් ම වීඩියෝපට හා අන්තර්ජාලය මඟින් ද කඩුව හා සම්බන්ධ ශාන්තිකර්ම අවස්ථා නිරීක්ෂණය කරන ලදී. කෙසේ වෙතත් ඍජු නිරීක්ෂණ සඳහා අවකාශ සැලසෙන ශාන්තිකර්ම අවස්ථා වත්මන් සමාජය තුළ සුලබ නොවන හෙයින් වක්‍ර නිරීක්ෂණ ක්‍රමයත් සම්මුඛ සාකච්ඡා ක්‍රමයත් දත්ත රැස් කිරීම සඳහා වඩාත් උපස්ථම්භක විය. පුස්තකාල අධ්‍යයනය යටතේ අනාවරණය කරගන්නා ලද දත්ත තහවුරු කර ගැනීමට ද උක්ත විධි ක්‍රම ඵලදායී ලෙස යොදා ගැනීමට හැකියාව ලැබිණි.

මෙම පර්යේෂණය සඳහා උඩරට හා පහතරට යන සම්ප්‍රදායන් ද්විත්වය පමණක් අධ්‍යයන සීමාව වශයෙන් තෝරා ගන්නා ලදී. බලි ශාන්තිකර්ම අධ්‍යයන සීමාවට ඇතුළත් නොවිණි. උක්ත ප්‍රදේශවලට අයත් යක්ෂ හා දේව ශාන්තිකර්ම සියලු ශාන්තිකර්ම නිරීක්ෂණයට අවකාශ නොලැබුණ ද ශාන්තිකර්ම ක්ෂේත්‍රයෙහි ප්‍රවීණ ශිල්පීන් හා ආචාර්යවරුන් අධ්‍යයන නියැදියට ඇතුළත් කර ගැනීම හේතුවෙන් කඩුව භාවිත කෙරන අවස්ථා සම්මුඛ සාකච්ඡා හරහා ආවරණය කර ගැනීමට හැකි විය. උඩරට නර්තන සම්ප්‍රදාය හා පහතරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ බොහෝ වන හෙයින් සම්මුඛ සාකච්ඡා සඳහා දත්ත දායකයින් තෝරා ගැනීමේ දී බස්නාහිර පළාතේ කොළඹ හා කලුතර යන දිස්ත්‍රික්කවල තාවකාලික ව හෝ ස්ථිර වශයෙන් පදිංචි ව සිටින උඩරට හා පහතරට නර්තන සම්ප්‍රදායන්හි ප්‍රවීණ නර්තන ශිල්පීන් හා නර්තන ආචාර්යවරුන් පමණක් යොදා ගන්නා ලදී.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 3.1 ශාන්තිකර්ම හැඳින්වීම

ශාන්තිකර්ම යනු මිනිසුන්ගේ ලෞකික ජීවන අපේක්ෂා ඉටු කරලනු වස් ග්‍රහයින්, දෙවියන් හා යක්ෂයින් වෙනුවෙන් පවත්වන අභිචාර වෙසෙසකි. සිංහල ගැමි ආගමෙහි යක්ෂ, භූත හා ප්‍රේත කොටස්වලින් මෙන් ම විවිධ ග්‍රහ බලපෑම්වලින් ඇති වූ දෝෂ දුරුකොට සෙත් ශාන්ති ළඟා කර ගැනීමට නිර්මාණය වූ ප්‍රධාන ආගමික විධි ක්‍රමයක් වන්නේ ශාන්තිකර්ම යි. දේශීය ශාන්තිකර්ම ප්‍රධාන වශයෙන් උඩරට, පහතරට හා සබරගමු ලෙස සම්ප්‍රදාය අනුව කොටස් ත්‍රිත්වයකට බෙදෙන අතර මෙකී සම්ප්‍රදායන්හි දේව තොවිල්, යක් තොවිල් හා බලි තොවිල් වශයෙන් ශාන්තිකර්ම වර්ග ත්‍රිත්වයකි. උඩරට සම්ප්‍රදාය ශ්‍රී ලංකාවේ උඩරට ප්‍රදේශ නමින් හඳුන්වන සතර කෝරළය, මහනුවර ප්‍රදේශය හා සත් කෝරළය හා උඩරට යන ප්‍රදේශයන්හි විශේෂ වශයෙන් ව්‍යාප්ත වී ඇත (දිසානායක, 2020). මීට අමතර වශයෙන් උඩු නුවර, යටි නුවර, වරකාපොල, පොල්ගහවෙල, මාතලේ, නුවර එළිය, දුම්බර, හේවාහැට, තුම්පනේ, හේවාහැට ආදී

ප්‍රදේශ මූලික කර ගනිමින් ද ප්‍රචලිතව පවතී. උඩරට නර්තන සම්ප්‍රදායෙහි ප්‍රධාන ශාන්තිකර්මය වන්නේ ''කොහොඹා කංකාරි ශාන්තිකර්මය'' යි. මුදියන්සේ දිසානායක දක්වන්නේ, වර්තමානයේ උඩරට නමින් හඳුන්වන සියලු ම නර්තනාංග ඒ තුළ අන්තර්ගත හෙයින් එය උඩරට නර්තන සම්ප්‍රදායේ කෝෂ්ඨාගාරය ලෙස හඳුනාගත හැකි බව යි (දිසානායක, 2010). උඩරට සම්ප්‍රදායට අයත් අනෙකුත් ප්‍රධාන ශාන්තිකර්ම ගණයට වලියක් මංගල්‍යය හා කඩවර කංකාරිය අයත් වේ. එමෙන් ම නවග්‍රහයින් උදෙසා බලි ශාන්තිකර්ම ද පැවැත්වේ.

පහතරට හෙවත් රුහුණු සම්ප්‍රදාය දකුණු දිග වෙරළ තීරය මූලික කොට ගත් ගාල්ල, මාතර, බෙන්තර, හම්බන්තොට මෙන් ම හොරණ, කළුතර, අම්බලන්ගොඩ ආදී ප්‍රදේශ මූලික කොට ගනිමින් ව්‍යාප්ත වී ඇත. වර්තමානය වන විට දිවයින පුරා ම විහිදී ඇති මෙම පහතරට සම්ප්‍රදායෙහි ප්‍රධාන ශෛලීන් කිහිපයක් පවතී. එනම්, මාතර ශෛලිය, බෙන්තර ශෛලිය හා රයිගම ශෛලිය යනුවෙනි (කෝට්ටේගොඩ, 2013). පහතරට සම්ප්‍රදායෙහි දේව තොවිල් වශයෙන් ගම්මඩු, පූනා මඩු, මල් මඩු ආදියත්, යක් තොවිල් වශයෙන් සන්නි යකුම, රට යකුම, සූනියම් යාගය, මහසෝන් සමයම, කළු කුමාර සමයම, ගරා මඩුව යනාදියත්, නව ග්‍රහයින් උදෙසා බලි තොවිල් යනාදියත් පවත්වයි (දිසානායක, 2010).

ශාන්තිකර්මය හා සම්බන්ධ වන පුද්ගලයන්, දෙවි දේවතාවුන්, යක්ෂයන් ද උපභෝග පරිභෝග වස්තු වශයෙන් යෙදෙන රංග භාණ්ඩ හා පූජා භාණ්ඩ වැනි භෞතික දෑ මෙන් ම ශාන්තිකර්මය හා බැඳෙන ස්ථාන හා සිද්ධි සඳහාත් අධිමානුෂික තත්ත්වයක් හා බලයක් පවරමින් ගුප්තත්වයක් ආරෝපණය කිරීම ශාන්තිකර්මයක දී සිදු වේ. ඒ හරහා ආතුර පාර්ශ්වය තුළ ගෞරව සම්ප්‍රයුක්ත බියක් ඇති කරමින් ඉෂ්ටාර්ථසිද්ධි සාධනය අපේක්ෂිත ය. විශේෂයෙන් ම රංග භාණ්ඩ හෝ පූජා භාණ්ඩ වශයෙන් ශාන්තිකර්මයනට එක් කර ගන්නා භෞතික වස්තු හුදු සංකේතාත්මක ප්‍රකාශන ලෙසින් මෙන් ම අභිචාරාර්ථයෙන් ද ශාන්තිකර්මයනට එක් කර ගන. ඒවා අභිචාරාර්ථයෙන් යෙදෙන කළ ශුද්ධ වස්තු බවට පත් කිරීම සඳහා ජේකිරීම වැනි සුවිශේෂ ආගමික විධික්‍රම ද උපයෝගී කර ගනී.

### 3.2 උඩරට සම්ප්‍රදායයෙහි ශාන්තිකර්මයන්හි කඩුව භාවිතය

උඩරට ප්‍රධාන ශාන්තිකර්මය වන කොහොඹා යක් කංකාරියෙහි දී කඩුව නම් වූ ආයුධය රංග භාණ්ඩයක් වශයෙන් භාවිත වනවාට වඩා පූජා භාණ්ඩයක් හා දේවාභරණයක් ලෙස භාවිත වන බව ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් අනාවරණය විය. එහි ලා විශේෂ අවස්ථාවක් වන්නේ දේවාභරණ වැඩමවීම යි. මෙම චාරිත්‍රයේ දී කඩුව දෙවියන්ගේ ආභරණ ගණයෙහි ලා සලකමින් යාග භූමියට වැඩම කරවයි. එයට හේතුව කොහොඹා කංකාරියට සම්බන්ධ වන දේව කොට්ඨාස කඩුව භාවිත කරන ආකාරය ශාන්තිකර්ම සාහිත්‍යයෙහි නිරූපණය ව තිබීම යි.

බණ්ඩාර දෙවි හැට හත් කට්ටුව යනු කොහොඹා කංකාරි ශාන්තිකර්මය විෂයෙහි පුද ලබන්නා වූ ප්‍රධාන දේව මණ්ඩලයකි. එකී බණ්ඩාර දෙවි හැට හත් කට්ටුව අතැති ආයුධ අතුරින් සෑම දෙවි කෙනෙකුට ම පොදු වූ දේව ආයුධයක් ලෙස කඩුව දැක්වේ. එම කඩු වංගු කඩු, ඇද කඩු, මිටි කඩු, දුනු කඩු, මැදහං කඩු...... ආදී වශයෙන් නම් කෙරේ. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ පුද ලබන්නා වූ තවත් සුවිශේෂ දෙවි කෙනෙක් ලෙස හඳුන්වන වීරමුණ්ඩ දෙවියන් අතැති ව ද කඩුව නම් ආයුධය පවතින බව සඳහන් වේ. වීරමුණ්ඩ දෙවි කෝල්මුර ගායනාවන්වල දැක්වෙන පරිදි වීරමුණ්ඩ දෙවියන්ගේ කඩුව වංගු කඩුව යි.

*'වංගු කඩුව ගෙන යුද්ධ කරන්නට ආවේ කවුරුද අපට උඩින්*
*තොංගු වෙලාවත් පනින්න බැරි ලෙස අහස උසට ගිනි කඩු මවමින්*

*තොංගු වෙලා කඩු පලිස් හරඹයෙන් පැන්නයි ඒ ගිනි වැටට උඩින්*
*වංගු කඩුව ගෙන ගිනි කන්දෙන් පැන යකුන්ට බැට දීලා වඩිමින්''*
(තරිඳු කාවින්ද ප්‍රසාද්, සංසා, 2021 පෙබරවාරි 18).

වංගු කඩුව වීරමුණ්ඩ දෙවියන්ගේ ප්‍රධාන ආයුධ අතුරින් එකක් බවත් එකී කඩුව තම ආරක්ෂාවට හා යුධ කිරීම සඳහා යොදා ගෙන ඇති බවත් මෙනයින් පැහැදිලි වේ. මෙකී ආයුධ කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ දී දේවාභරණ වැඩමවීම නම් වූ චාරිත්‍රාංගයේ දී වීරමුණ්ඩ දෙවි සංකේතවත් කරමින් අයිලය වෙත වැඩමවනු ලබයි.

පංචතූර්ය නාද සහිත ව පෙරහැරෙන් දේවාභරණ ආසන්න දේවාලයේ සිට ශාන්තිකර්ම භූමියට වැඩම කරවීම සිදු වේ. මෙසේ වැඩම කෙරෙන්නේ දේවාලයේ තැන්පත් කොට ඇති දේවාභරණ යි. එසේ වැඩම කරවීමට පෙර දෙහි යොදා සකස් කරගත් ජල බඳුනකින් ආයුධ නානුමුර කොට යහන මත එලා ඇති පිරුවටය මත තැන්පත් කෙරෙන අතර මෙකී දේවාභරණ අතර සළඹ යුගල, කඩුව, ත්‍රිශූලය, කිනිස්ස, හෙල්ලය, අංකුසය, කැත්ත සහ දෙවිවරුන්ගේ රූප ද ඇතුළත් වේ. එසේ දේවාභරණ අතරට කඩුව ඇතුළත් වී ඇත්තේ බණ්ඩාර දෙවිවරු හා දැඩිමුණ්ඩ දෙවියන් සංකේතවත් කරමිනි (පීරිස්, 2009). මීට අමතර ව සූනියම් හෙවත් ගම්භාර දෙවියන් මෙන් ම  කතරගම දෙවියන් ද කඩු අත දරන දෙවිවරුන් සේ සැලකේ.

දේවාභරණ වැඩමවීම උඩරට නර්තන සම්ප්‍රදායේ පමණක් නොව පහතරට නර්තන සම්ප්‍රදායෙහි ද දක්නට ලැබෙන්නා වූ ප්‍රධාන චාරිත්‍ර විධියකි. දෙවියන් සතු දේවාභරණයන් වැඩම කිරීමෙන් සංකේතාත්මක ව දෙවියන් යාගමඩලට අරක්ගැනීම නිරූපණය කෙරේ (ප්‍රියන්ත කරුණාතිලක, සංසා, 2021 පෙබරවාරි 19). කෙසේ වෙතත් දේවායුධ වශයෙන් සංකේතාත්මක ව යොදාගනු විනා එම අවස්ථා නර්තනය හා සම්බන්ධ වන ආකාරයක් හඳුනාගත නො හැකි ය.

කොහොඹායක් කංකාරියෙහි කඩුව භාවිත කරමින් රඟුම් දක්වන අවස්ථා දුලබ ය. කඩුව රැගෙන එක එල්ලේ සිදු කරන්නා වූ පුද පෙළපාළි කොහොඹා කංකාරි ශාන්තිකර්මයෙහි අන්තර්ගත නොවන බව කවීකාචාර්ය සුමතිපාල ශිල්පාධිපති මහතාගේ අදහස යි (සුමතිපාල ශිල්පාධිපති, සංසා, 2021, පෙබරවාරි 20). කොහොඹා යක් කංකාරි ශාන්තිකර්මයෙහි එන යක්ෂ කොට්ඨාසයට අයත් යක්ෂයෙකු වශයෙන් හා දෙවි කෙනෙකු වශයෙන් කළු කුමාරයා  පිදවිලි ලබා ගනී. එහිදී කළු කුමරු සංකේතවත් කිරීම සඳහා මෙන් ම කළු කුමාර දෙවියන්ගේ කීම, කළු කුමාර යාදින්න හා කළු කුමාර දෙවිඳුන්ගේ බත් මාලාව යන පද්‍ය සාහිත්‍යයන්හි ද කඩුව පිළිබඳ ව සඳහන් වේ.

*'වංග ගිරිය ඇතු හෙළිකර එන ලෙස නිරොහි පද පද අල්ලන්නේ*
*පංගු බේදයට කුඩා මහත් අය පේන අසන්නට රැස්වන්නේ*
*වෙන්ගන් වළළුත් අතලාගෙන දෙවි කඩු දෙක ගෙන නද කරවන්නේ*
*මාගේ මේ දුක් දුරු කරවන්නට කළු කුමාර දෙවි වඩිමින්නේ''*
*(දිසානායක, 1998, 146).*

මීට අමතර වශයෙන් කොහොඹා කංකාරි ශාන්තිකර්මයෙහි කඩුව නම් වූ ආයුධය යොදා ගන්නා අවස්ථා හමු නොවේ.

උඩරට නර්තන සම්ප්‍රදායෙහි දෙවියන් මූලික තවත් දේව ශාන්තිකර්මයක් වන්නේ හත්දා වලියකුම හෙවත් වලියක් මංගල්‍යය යි. මෙකී වලියක් මංගල්‍යය යනු ඓතිහාසික දළදා පෙරහර මංගල්‍යය අවසන් වීමෙන් අනතුරුව එකී පෙරහර මංගල්‍යය සඳහා සහභාගී වූ සියල්ලන්ට ආශිර්වාද කොට වස් දොස් දුරු කිරීම උදෙසා පවත්වනු ලබන්නකි (දිසානායක, 2010, 58, 59).

මෙම වලියකුම් මංගල්‍යය හා බැඳී පවතින පූර්ව චාරිත්‍රාංගයක් වන දිය කැපීමේ චාරිත්‍රය හා කඩුව බැඳී පවතී. නමුත් මෙම දිය කැපීමේ චාරිත්‍රය උඩරට සම්ප්‍රදායේ දළදා පෙරහැර මූලික කොට ගෙන පමණක් නොව බොහෝමයක් දේවාල හා පුණ්‍ය භූමි මුල් කොටගෙන පෙරහර කිරීමෙන් පසු පවත්වන චාරිත්‍රයකි (ප්‍රියන්ත කරුණාතිලක, සංසා, 2021 පෙබරවාරි 19). මෙම දිය කැපීමේ චාරිත්‍රය හරහා සිදුවන්නේ පෙරහර ආරම්භයේ දී සිටුවන ලද කප මහවැලි ගංගාවේ පා කර යැවීම හා සමගාමී ව කඩුවෙන් ජලය දෙබෑ වන ලෙස ජලයට පහර එල්ල කොට එසේ ජලය නැවත ළං වීමට පෙර කෙණ්ඩියට ජලය ලබා ගැනීම යි. එසේ ලබා ගන්නා ජලය ඊළඟ වර්ෂයේ පෙරහර පවත්වන තුරු දේවාලයන්හි තැන්පත් කරනු ලබයි (මහින්ද කුලසිංහ, සංසා, 2021 පෙබරවාරි 18).

මෙකී වලියකුම් මංගල්‍යයට ප්‍රථම ව පවත්වන දිය කැපීමේ චාරිත්‍රය සඳහා යොදා ගන්නා කඩුව රන් කඩුවක් ලෙස ද සැලකේ. එසේ පෙරහර චාරිත්‍රය වාර්ෂික ව පවත්වන අතර මේ සඳහා කඩුව භාවිත කරනුයේ ද පූජා භාණ්ඩයක් වශයෙනි. කඩුවෙහි මූලික කාර්යය වන කැපීම හෙවත් පහර දීම මෙම චාරිත්‍රයේ දී සිදු කළ ද එය සිදු කරනු ලබන්නේ අභිචාරාර්ථයෙනි.

උඩරට සම්ප්‍රදායෙහි දේව තොවිල් ගණයට ගැනෙන තවත් ශාන්තිකර්මයක් වන්නේ ගම්මඩු ශාන්තිකර්මය යි. උඩරට දී ගම්මඩුව යනු ප්‍රධාන දේව තෝත්‍රයක් ලෙස නො සැලකෙන්නෙකි. කෙසේ වෙතත් ගම්මඩු යාගයේ අවසානයට දෙවිවරුනට තමන්ගේ විමන්වලට ආපසු වඩින ලෙස ආයාචනා කර ශාන්තිකර්මය සඳහා ඉදි කළ සියලු සැරසිලි මුවහත් ආයුධයකින් කපා දම යි (පීරිස් ,2009). මෙලෙස මුවහත් ආයුධය වශයෙන් සමහර අවස්ථාවන්හි දී කඩුව නැමැති ආයුධය ද යොදා ගැනේ (ප්‍රියන්ත කරුණාතිලක, සංසා, 2021 පෙබරවාරි 19).

මෙසේ සැරසිලි ආයුධයකින් කප්පාදු කිරීමක් උඩරට වෙනත් ශාන්තිකර්මයක දැක ගත නො හැක. නමුත් පහතරට සූනියම් ශාන්තිකර්මයේ දී අටමඟල වීදිය මෙලෙස කපා දැමේ (අලුත්ගේ සහ රණවීර, 2024) මෙය ද ඊට සමාන චාරිත්‍රාංගයක් වශයෙන් නම් කිරීම නිවැරදි ය. කෙසේ වුවත් මෙම කාර්යය සඳහා කඩුව වැනි ආයුධය යොදා ගැනීමට හේතු වී ඇත්තේ එය සතුව පවතින තියුණු මුවහත් භාවය විය හැකි ය.

උඩරට නර්තන සම්ප්‍රදායෙහි පවතින අවශේෂ තොවිල්වල දී වින කැපීම් හා වින කිරීමේ කාර්යය සඳහා කඩුව යොදා ගැනේ. එහි දී පුහුල කැපීම, රතු ගැට අන්නාසි කැපීම වැනි අවස්ථාවන්හි කඩුව යොදා ගන්නා අතර එකී කඩුව සඳහා බලගතු දිෂ්ටි මන්ත්‍ර මතුරන බව සඳහන් වේ (තරිඳු කාවින්ද ප්‍රසාද්, සංසා, 2021 පෙබරවාරි 18).

උඩරට ශාන්තිකර්මයන්හි කඩුව නම් වූ ආයුධය භාවිත වීම පෙළපාළි අවස්ථාවල එතරම් ප්‍රකට නොවේ. නර්තන හා බැඳුණු රංග භාණ්ඩයක් වශයෙන් භාවිත වනවාට වඩා පූජා භාණ්ඩයක් හා දේවාභරණයක් ලෙස භාවිත වීම වැඩි වශයෙන් දැකගත හැකි වේ. කඩුව දේවායුධ ලෙස යොදා ගැනීමේ අභිප්‍රාය වන්නේ ශාන්තිකර්ම භූමිය තුළට දෙවියන් වැඩම කරවීම සංකේතවත් කිරීම යි.

### 3.3 පහතරට සම්ප්‍රදායයෙහි ශාන්තිකර්මයන්හි කඩුව භාවිතය

උඩරට ශාන්තිකර්මයනට සාපේක්ෂ ව පහතරට ශාන්තිකර්මයන්හි යක්ෂ කොට්ඨාස වැඩි වශයෙන් පුද ලැබීම හේතුවෙන් පහතරට ශාන්තිකර්මයන්හි කඩුව නම් ආයුධය දේවාභරණයක්, පූජා භාණ්ඩයක් හා රංග උපකරණයක් ලෙස යොදා ගන්නා අවස්ථා බහුල ය.

පහතරට නර්තන සම්ප්‍රදායේ දෙවියන් මුල් කොට ගත් ප්‍රධාන ශාන්තිකර්මය වන්නේ දෙවොල් මඩු ශාන්තිකර්මය යි. එහි එන මරා ඉපැද්දවීම නම් නාට්‍යමය පෙළපාළිය

කඩුව රංග භාණ්ඩයක් වශයෙන් සම්බන්ධ වන විශේෂතම අවස්ථාවකි. පඬිරට රජ බිසවගේ සළඹ සොරකම් කිරීමේ සැකය මත පාළඟ කුමරු හෙවත් කන්නගියගේ ස්වාමිපුරුෂයා මරුමුවට පත් කිරීම මින් නිරූපිත යි. පත්තිනි දේවිය, පාලඟ කුමරා, කාලි කෙල්ල, ගොපල්ලන්, කුමාරවරු දෙදෙනා, වධකයා ආදී චරිත මෙම පෙළපාළියට අයත් ය. පාළඟ කුමරුගේ හිස ගසා දැමීමට එක්වන වධකයා කළු ලොම් සහිත හැට්ටයක් ඇද, යටි කයට සුදු රතු මිශ්‍ර රෙදිකඩක් කොටට ඇඳ, මරු යක් වෙස් මුහුණක් පැළඳ, රතු වද මල් දමක් කරේ පැළඳ, අතින් කඩුවක් හා මරු බාන්වැල් පොටක් ගෙන සැරසී සිටි (සමරසේකර, 1995). මෙහිදී කඩුව වධක කාර්යය නිරූපණය කරන හුදු රංග භාණ්ඩයක් වශයෙන් භාවිත කරන අතර ඒ සඳහා යොදා ගන්නේ ස්වාභාවික අමුද්‍රව්‍යවලින් සකස් කර ගත්තා වූ කඩුවකි. ලෝහමය කඩුවක් මෙම රංගන අවස්ථාව සඳහා යොදා නො ගනී (සුසන්ත රූපතිලක, ස.සා, 2021, ජනවාරි 31). මෙනයින් පැහැදිලි වන්නේ අතීත සටන් ආයුධයක් ව පැවැති කඩුව නම් වූ ආයුධය නාට්‍යමය ස්වරූපය තුළ වධක කාර්යය තීව්‍ර කිරීම හා නාට්‍යමය ස්වරූපය ඉස්මතු කිරීමට සංකේතාත්මක ව යොදා ගෙන ඇති බව යි. පහතරට නර්තන සම්ප්‍රදායේ දේව තෝවිල් ගණයට ගැනෙන්නා වූ මඩු ශාන්තිකර්මයන්හි පත්තිනි හා දෙවොල් දෙවි මූලික කොට ගෙන පවත්වනු ලබන හෙයින් කඩුව රැගෙන සිදු කරන පූජා විධි රටාවක් මීට අමතර ව දක්නට නො ලැබේ.

පහතරට නර්තන සම්ප්‍රදායෙහි ම යක්ෂයින් මුල් කොට ගත් යක් තොවිල්වල මඩු තෝත්‍රවල දක්නට නොලැබුණු කඩු ආශ්‍රිත චාරිත්‍ර වාරිත්‍ර හා නර්තනාංගයන් කිහිපයක් ම ඇත. ඒ අතර පහතරට යක් තොවිල් ගණයට ගැනෙන දහ අට සන්නිය හෙවත් සන්නියකුම ශාන්තිකර්මය විශේෂ ය. ''සන්නි යකාගෙන් ඇති වන දෝෂ අන්ධකාරයක් මග හරවා ගනු වස් ඒ යකා ප්‍රධාන ව එම සමාගමට අයත් අන් යකුන් උදෙසා පවත්වනු ලබන පුද පූජා ඇතුළත් ශාන්තිකර්මය සන්නියයකුම හෙවත් දහඅට සන්නිය නමින් හැඳින්වේ. සන්නි සමයම යන ප්‍රාදේශීය යෙදුමින් ද ඇතැම් විට මෙම ශාන්තිකර්මය හැඳින්වේ'' (කෝට්ටේගොඩ, 2013: 156). සන්නියකුම් ශාන්තිකර්ම උපත් කථාව වන සංඛපාල කතා වස්තුව සන්නියකුම ශාන්තිකර්මයේ බොහෝ චාරිත්‍ර අංග හා සම්බන්ධ වන්නකි. එම කතා ප්‍රවෘත්තිය මෙසේ වේ,

ලිච්ඡවී ගෝත්‍රයට අයත් සංඛපාල රජ කුරු රට යුධයට ගියේ ය. මේ අවධිය වන විට බිසව වන අසුපාල කුමරිය රජුගෙන් ගැබ්ගෙන සිටි අතර මේ බව රජතුමා දැන නො සිටියේ ය. අඹ කෑමේ දොළක් බිසවට හටගත් අතර අඹ අවාරය හේතුවෙන් මී අඹ සොයා ගැනීම අපහසු වුවත් ප්‍රධාන ඇමති විසින් මහන්සි වී එක මී අඹයක් දේවිය වෙත ගෙන දෙන ලදී. මෙම මී අඹය අනුභව කරන මොහොතේ එයට ලොල් වී පැමිණි දාසියක් එම අඹයෙන් කොටසක් ඉල්ලුව ද දේවිය කිසිවෙකුට නො දී තනි ව අඹය ආහාරයට ගත්තා ය. මෙයින් කෝපයට පත් දාසිය යුද්ධයෙන් දිනා පැමිණෙන රජුගේ පෙරමගට ගොස් අසුපාල දේවිය ප්‍රධාන ඇමති නිසා ගැබ්ගෙන ඇති යන මුසාව පවසන ලදී. එමඟින් කෝපයට පත් රජතුමා කිසිදු වග විභාගයකින් තොර ව තම දේවිය ව පුබ්බේරිය ගසක එල්ලා දෙපළු වී යන අයුරින් මරණයට පත් කරන ලෙස නියෝග කර ඇත (පීරිස්, 2009). සන්නි යකුම් ශාන්තිකර්මයේ මරු සන්නිය නම් සන්නිය රඟ දැක්වීමේ දී මෙලෙස කඩුවෙන් කොටා බිසව මරණයට පත් කළ කතා ප්‍රවෘත්තිය විස්තර කෙරේ.

> *සන්නි යකා - ඉතිං ගුරුන්නාන්සේ අපේ තාත්තා නිවැරැද්දේ වැරැද්දට අපේ අම්මා පුබ්බේරිය ගහක එල්ලලා කඩුවෙන් ගහලා මරන්ට නියම කළා.*
> *ගුරුන්නාන්සේ - ඉතිං වලාමේ කඩුවෙන් ගහපු වෙලාවේ තමා කොහෙද හිටියේ*
> (කෝට්ටේගොඩ, 2013: 172).

ශාන්තිකර්ම හා සම්බන්ධ බොහෝමයක් පුරාවෘත්ත කතා රජවරුන් හා රාජපුරුෂයන් වටා බැඳී පැවතීම හේතුවෙන් කඩුව නම් ආයුධය ඒවා හා නිරන්තරයෙන් සම්බන්ධ වී

ඇත. මෙහි දී කඩුව භාවිත කරන්නේ කිසිදු අභිචාරාර්ථයකින් තොර ව හුදු රංග භාණ්ඩයක් වශයෙන් පමණි.

කඩුව අත දරන යක්ෂයින් පහතරට ශාන්තිකර්මයන්හි දී ද පුද ලැබේ. සන්නියකුම නම් යක් තොවිලයෙහි පුද ලබන ප්‍රධාන යක්ෂයෙකු වන කළු යකා එවැන්නෙකි. සන්නියකුම් යාගයේ හැන්දෑ සමයමේ පුද ලබන යකුන් හතර දෙනා වන කළු යකා, රීරි යකා, අභිමාන යකා හා තොට යකා යන යකුන් අතුරින් මුල් වරට පැමිණෙන්නේ කළු යකා ය. මුහුදින් එතෙර කළු ගල් දූව මැද කළුගල් පව්වේ කුවේණි නම් ළඳකගේ කුසෙන් උපන් කළු යකා වෙසමුණි රජුගෙන් අණ වරම් ලබාගත් තෙද බල යක්ෂයෙකි (සමරසේකර, 1995). නමුත් ජ්‍යෝෂ්ඨ මහාචාර්ය ජයසේන කෝට්ටෙගොඩ දක්වන්නේ කළු යකා උප්පත්තිය සත් මුහුදකින් ඒ දේශයේ කළුගල් දූව මැද පැන නැගි ඉලුක් මල් විමානයේ වාසය කරන බව යි. එසේ ම ඔහු දක්වන තවත් මතයක් වන්නේ මායා රට, මායා කෝවිලේ, මා ඉලුක් පඳුරේ, මුදුන් මානෙල් මල් රේණුවේ වාසය කරන කළු යකා කරඬු බානා බිසවගේ කුසින් උපන් බව යි.

වෙසමුණි රජුගෙන් අණ වරම් ලබා ගත් තෙද බල යක්ෂයකු සේ සැලකෙන කළු යකා (සමරසේකර, 1995) හැන්දෑ සමයමෙහි දී ප්‍රමුඛත්වය දරන අතර කළු ඇඳුමකින් සැරසී, කළු කොණ්ඩයක් හා කළු වෙස් මුහුණක් පැළඳ අතට කඩුවක් දරමින් සභාගත වේ (කෝට්ටේගොඩ, 2009). කළු යකාගේ මෙම භයානක රූපකාය හා චරිතය පිළිබඳ ව පද්‍ය සාහිත්‍යයෙහි මෙසේ දක්වා ඇත.

> *''නපුරු දුජන අවගුණ පාමින් යකු බැස මෙනර ලොව ට*
> *විදුරු කඩුව ගති එයකා මෙනර ලොවට ගොඩ බසින ට*
> *සොඳුරු ගුණේ නැතිවම යකු වැසෙමින් දුටු අඟනන් හට*
> *ඉඳුරු දිගින් වර කළු යකු මෙපුද බලා පිදවිල්ල ට''*

එසේ පැමිණෙන කළු යකු අතැති කඩුව 'විදුරු කඩුව' යන නමින් හැඳින්වේ. යාගපොළට එන යක්ෂයින් බොහෝ දෙනකු අතට ආයුධයක් ලබා දී ඇත්තේ එම යකුන්ගේ යක්ෂ ගතිය හා භයානක ස්වරූපය ඉස්මතු කරලීම සඳහා ය (රෝහණ පීරිස්, සෘස, 2021, පෙබරවාරි 02). එසේ ම මෙම කළු යකු හට විදුරු කඩුව නමින් හඳුන්වන්නා වූ කඩුව ලබා දීම මඟින් කළු යකාගේ රෞද්‍ර සහ භයානක ස්වරූපය තවත් ඉස්මතු කෙරේ. කළු යකා නර්තනයේ යෙදෙනුයේ ද මෙම කඩුව අතෙහි තබා ගනිමින් ය. කඩුව ළෙලවීම හා ඇනීම, කැපීම වැනි චලන යාග මඬල තුළ ඉදිරිපත් කෙරේ. එසේ ම කඩුව මුවහත් කිරීම හා ලේ පිස දැමීමත් යාග මඩල වටා සිටින ප්‍රේක්ෂකයන් මෙන් ම ආතුර පාර්ශ්වය දෙසට ද යමින් කඩුව ඔවුන් දෙසට යොමු කරමින් භයානක චලන දක්වයි. කළු යකාට ගැයෙන කවි පදවලින් පමණක් නොව කළු කුමරු හා පවත්වන දෙබස් සංවාද අවස්ථාවන්හි ද කඩුව පිළිබඳ ව සඳහන් වේ (කාරියවසම්,1976). ඉන් ආතුර මනසට අන්තර් ග්‍රහනය කෙරෙන්නේ සැබෑ කඩුවක් අතැති භයානක යක්ෂයෙකි. ප්‍රථමයෙන් කඩුවෙන් භයානක රසයක් ජනිත කරන නමුත් නර්තනය අවසාන වන විට සියුම් හාස්‍යයක් මතු කරලමින් ආතුර මනස සුවපත් කරලන ශාන්ත රසයක් ජනිත කිරීමට නර්තන ආකෘතිය සැකසී ඇති. ඉන් යක්ෂයාගේ භයානක බව ඉවතලමින් තමාට ලෙඩ කළ යක්ෂයාගෙන් තව දුරටත් තමාට විපතක් නොවන බව ආතුර මනසට හැඟවීමත් පරමාර්ථ වේ. ආතුර පාර්ශ්වය භාව විශෝධන තත්ත්වයකට ගෙන ඒම ඉන් අපේක්ෂිත යි. මෙහි දී කළු යකා අතැති කඩුව හා බැඳි චලන හා සංවාද ද ආතුර මනස විශ්‍රාන්ති තත්ත්වයක් කරා ගෙන ඒමට අවශ්‍ය පරිදි අනුකරණ ක්‍රියාවලියකට යටත් වෙයි.

සාම්ප්‍රදායික නර්තන ශිල්පී සුසන්ත රූපතිලක මහතා කළු යකු පිළිබඳ ව මෙසේ සඳහන් කර ඇත. එනම්, ''වා, පිත්, සෙම් යන රෝග අතුරින් කළු යකා සෙම හෙවත් ශ්ලේෂ්ම යන්නට සමාන ව කටයුතු කරන බවත් කළු යකු අතැති කඩුවෙන් ප්‍රතීයමාන කෙරෙනුයේ එකී සෙම රෝගය ශරීර අභ්‍යන්තරය කපාගනිමින් ඇතුළට ගමන් කරන

බවත් ය'' (සුසන්ත රූපතිලක, ස.සා, 2021, ජනවාරි 31). නමුත් ඊට වෙනස් මතයක් දරන සාම්ප්‍රදායික නර්තන ශිල්පී කුලසිංහගේ අදහස වන්නේ කළු යකු කිපුණු සෙමට සමාන බව සත්‍ය වුවත් අතැතිව පවතින කඩුව තුළින් කිසිඳු ව්‍යංගාර්ථයක් ප්‍රකාශ නොවන බව යි (මහින්ද කුලසිංහ, සඃ සා, 2021, පෙබරවාරි 18). කළු යකා අතැති කඩුව එම යක්ෂයාගේ රූපකාය හා රෞද්‍ර පෙනුමත් නාට්‍යෝචිත බවත් ප්‍රතීයමාන කිරීමටත් රංගෝපකරණයක් යොදා ගෙන ඇත.

කඩුව රංගෝපකරණයක් වශයෙන් ගැනෙන සන්නියකුමෙහි එන තවත් වැදගත් නර්තන අවස්ථාවක් ලෙස කඩු පාළිය හැඳින්විය හැකි වේ. බෙන්තර සම්ප්‍රදායට අනුව සන්නියකුමෙහි පාළි දොළසකි. මාතර සම්ප්‍රදායෙහි පාළි අටෙකි. නමුදු සන්නියකුන් හට ආරාධනා කිරීමට ප්‍රථම ව පාළි දහසයක් කැඳවා සන්නි යකුනට ආරාධනා කිරීම සිරිතක් ලෙස පැවතුණු බව ජයසේන කෝට්ටේගොඩ සඳහන් කරයි.

වගු අංක 1. පහතරට සම්ප්‍රදායට අයත් පාළි

| | | |
|---|---|---|
| මාතර සම්ප්‍රදාය | අට පාළි | පන්දම් පාළිය, සළු පාළිය, කෙණ්ඩි පාළිය, කලස් පාළිය, තැඹිලි පාළිය, දුම්මල පාළිය, දළුමුර පාළිය, බිල්ලේ පාළිය. |
| බෙන්තර සම්ප්‍රදාය | දොළොස් පාළි | දූප පාළිය, කලස් පාළිය, **කඩු පාළිය**, පන්දම් පාළිය, සළු පාළිය, මුගුරු පාළිය. දළුමුර පාළිය, කෙණ්ඩි පාළිය, තැඹිලි පාළිය, අතුපාළිය, කුකුළු පාළිය, දුනු පාළිය |

(කෝට්ටේගොඩ, 2013).

උක්ත විග්‍රහයෙන් පැහැදිලි වන්නේ මාතර සම්ප්‍රදායෙහි එන පාළි නර්තනාංගවල කඩු පාළිය අන්තර්ගත නො වන බව යි. නමුත් බෙන්තර ශෛලියෙහි දොළොස් පාළි නර්තනාංගයන්හි කඩු පාළිය අන්තර්ගත ව ඇති බවත් සොළොස් පාළි නර්තනාංගයන් තුළ ද මෙම කඩු පාළි නර්තනාංගය ඇතුළත් ව ඇති බවත් අනාවරණය වේ.
කඩුව විටෙක දේව ආභරණයකි, රජ ආභරණයකි, යකුන්ගේ දිෂ්ටියට ලක්වන ආයුධයකි. එබැවින් මෙහි දී පූජා වස්තුවක් ගණයෙහි ලා ද මෙම රංගෝපකරණය යෙදේ. ආතුරයාට පැමිණ තිබෙන්නා වූ සියලු රෝග, දෝෂාන්ධකාරයන් පහ වී සුවය ලබා දෙන ලෙස පාළිය සඳහන් කරයි.

*''එරන් කඩුව හිස වට කරකවන — යකා*
*නරන් දැකපු සැණෙකින් නෙත් රවන — යකා*
*සුරන් මෙගුරු අනුහස් බලයෙන් නො — යෙකා*
*වරෙන් මෙරඟ බැස තෙද කඩු පාළි — යකා''*

(ආරියදාස, 2018: 165පි)

මෙහි කියැවෙන්නේ රන් කඩුවක් අතැති ව පාළියෙහි එන යකු යාග මඬලට පිවිසෙන බව යි. සාමාන්‍යයෙන් රන් කඩු භාවිත කරන්නේ උසස් කුලයෙහි රජවරු, සිටුවරු හා ප්‍රභුවරු ය. නමුදු මෙහි අතිශයෝක්තියෙන් යුක්ත ව කඩු පාළියෙහි කඩුව රන් කඩුවකට සමාන කර ඇති බව පෙන්වා දිය හැකි වේ. එසේ ම කඩුව අතැති ව පිවිසෙන යකුගේ තද ගති පැවතුම් පවා මෙම පද්‍ය සාහිත්‍ය ඔස්සේ නිරූපණය කර තිබේ.

මෙම පහතරට කඩු පාළිය නම් නර්තනාංගය ඉදිරිපත් කිරීමේ දී කඩු පදය නමින් පදයක් නටනු ලබයි. එහි පදය වන්නේ, '' ගුංදං දිංගත ගත්තං දිංගත ගත්ත ගදිත ගුඳ දැහිං දිං ගත'' යන්න යි (දිසානායක, 2001: 277පි).

කඩුව අතැති ව රඟ මඩලට පිවිසෙන කඩු පාළිය විසින් දෙබස් කථනය කෙරෙයි. මෙමඟින් කඩුවේ උත්පත්තිය හා කඩුවෙන් ඉටු කර ගනු ලබන ප්‍රයෝජන ආදිය උපහාසාත්මක ව ඉදිරිපත් කරනු ලබයි.

*පාලිය - මෙන්න ගෙනාවා බඩුව මාර බඩුව මේන් බලන්න බඩුව.*
*ගුරු - ඕක බඩුව නොවෙයි කඩුව, කොහෙන් ද ගෙනාවේ?*

(ආරියදාස, 2018: 164).

කඩු පාළියෙහි කවි මඟින් භයානක රසයක් මතු කළ ද මෙම දෙබස් සංවාදවලින් නැඟෙනුයේ හාස්‍යයකි. කඩුවේ උපත ගැන සඳහන් කිරීමේ දී පවා දෙපැත්ත කැපෙන ව්‍යංගාර්ථවත් වචන මාලාවක් ඒ සඳහා ශාන්තිකර්ම ඇදුරෝ යොදා ගනිති. කඩුවෙන් උද්දීපනය වන භයානක බව ඉවතලා ආතුර මනස සමනය කරලීමට ශාන්තිකර්ම ශිල්පියා උත්සහ ගෙන ඇති ආකාරයක් ඉන් ප්‍රකට වේ.

කඩු පාළිය තුළ කියැවෙන කඩුව ද සත්‍ය ආයුධයක් නො වන අතර එය ස්වාභාවික අමුද්‍රව්‍ය භාවිත කරමින් සකසා ගනු ලබන්නකි. යුධමය කාරණා හා ආත්මාරක්ෂාව උදෙසා යොදා ගත් කඩුව ශාන්තිකර්මයන්හි දී පූජා භාණ්ඩයක් හෝ රං භාණ්ඩයක් ලෙස යොදා ගැනීමේ දී ආරම්භයේ ජනිත කරලන භයානක රසය ක්‍රමයෙන් දුරුකරමින් අවසන හාස්‍යයක් ජනිත කරලමින් ආතුර මනස විශාන්ති ගැන්වීමේ උපක්‍රමයක් ලෙස යොදා ගෙන ඇති බව පෙළපාළි අධ්‍යයනයේ දී පැහැදිලි වේ.

ඉහතින් සඳහන් කරන ලද කළු යකා සහ කඩු පාළිය යන නර්තනාංග ද්විත්වය ම පහතරට නර්තන සම්ප්‍රදායෙහි එන මහසොහොන් යකු හෙවත් මහසෙහොන් දේවතාවාගෙන් සිදු වන අතුරු අන්තරාවන් ගෙන් මිදීම සඳහා කරනු ලබන මහසෝන් සමයම නම් වූ ශාන්තිකර්මයෙහි ද දක්නට ඇත. කඩුව භාවිත කරමින් සිදු කරන එකී නර්තන චලනයන්ගෙන් ද ප්‍රතීයමාන වන්නේ යක්ෂ චරිතය ඉස්මතු කරලීමට යොදා ගනු ලබන රංග භාණ්ඩයක් ලෙස මෙන් ම පාළිවල දී පූජා භාණ්ඩයක් වශයෙන් ද කඩුව හසුරවන බව යි (මහින්ද කුලසිංහ, සඃසා, 2021 පෙබරවාරි 18).

සූනියම, සූනියම් යාගය, සූනියම් කැපිල්ල, මැණික්පාල ශාන්තිය ආදී වූ නාමයන්ගෙන් හඳුන්වන සූනියම් දෙවියන් මූලික කොට ගෙන පවත්වනු ලබන සූනියම් ශාන්තිකර්මය ද පුද ලබන ප්‍රධාන දෙවියා කඩුවක් අත දරන යාගයකි. සූනියම් දෙවියන් විටෙක දෙවියකු ලෙසත් තවත් විටෙක යක්ෂයකු ලෙසත් හැඳින්වේ. පුර පක්ෂයට දෙවියන් ලෙසත් අව පක්ෂයට යකෙකු ලෙසත් දැක්වුව ද සූනියම් දෙවියන් සුදනන් හට දෙවියෙකු ලෙස හා දුදනන් හට යකෙකු ලෙස ක්‍රියා කරන බව ගුප්ත වෛද්‍ය ජිනසිරි අමරතුංග පවසයි (ජිනසිරි අමරතුංග, සඃසා, 2021 දෙසැම්බර් 20). ශාන්තිකර්ම පද්‍ය සාහිත්‍යයට අනුව සූනියම් ශාන්තිකර්මයේ ප්‍රධාන වන්නා වූ සූනියම් දෙවියන් අතැති ව ද කඩුවක් ඇත. එය වඩිග කඩුව නම් වේ.

*''අග්නි ඛන්ධංච හස්තේන - හස්තේන වඩිග කර්ගතේ*
*මුඛේන විෂ සර්පේන - ශීර්ෂේ පංච කේෂකේ''*

සිරසට නයි පෙන පහක් සහිත ජටාවකින් සැරසෙන සූනියම් දෙවියන්ගේ දෙඋකුල, දෙඋර, දෙපා, දැත්වල හා උදරයේ වෙලෙන ලද නයින් රැසක් සිටින අතර දකුණට වඩිග කඩුවක් ද වමතට ගිනි කබලක් ද රැගෙන කටින් ලේ පොළඟකු විකා සිටී. මැණික්පාල බිසව බිය ගැන්වීමේ අදහසින් වසවතු රජ මාළිගයට ගොස් ඇත්තේ ද සූනියම් යකාගේ ස්වරූපයෙන් බව අදාළ කවිවල දක්වා තිබේ.

*'' සුරතට කඩුවකි මරුවෙස් ගනිමින් සිරසට නයි පෙන තුනක් දරා*

*වමතට ගිනි කබලක් දරමින් සිට පෙන දෙකකුත් දෙ උකුලෙහි දරා*
*මුඛයට ලේ පොළගෙක් දරමින් සිට වාහනයට තුරගෙක් එ වරා*
*රොසකොට වසවත් එමතුරු මේ ලෙස සවු සත බිය කරනට එවරා''*
(කෝට්ටේගොඩ, 1998: 21, 22).

මෙලෙස සූනියම් යාගයේ ප්‍රධාන වන සූනියම් දෙවියන් කඩුවක් දරා සිටින බව ශාන්තිකර්ම සාහිත්‍යයෙහි දැක්වුණ ද එය නර්තනය සඳහා යොදා නො ගනී. ඇතැම් ශාන්තිකර්මයන්හි අයිලයට දේවාභරණ වැඩමවීමේ දී කඩුව ද වැඩම කිරීම දක්නට ලැබේ (ප්‍රියන්ත කරුණාතිලක, සඃ සා, 2021 පෙබරවාරි 19).

කඩුව නම් ආයුධය පූජා භාණ්ඩයක් වශයෙන් සූනියම් ශාන්තිකර්මයෙහි යොදා ගන්නා අවස්ථාවක් ලෙස අටමඟල කැපීම නම් කළ හැකි ය. අටමඟල තීන්දුව කැපීම නම් චාරිත්‍රයේ දී යකැදුරා විසින් ඉතාමත් භාර දූර කාර්යයක් ඉටු කරනු ලබයි. දින දෙකක් පටන් විශාල පිරිසකගේ වෑයමින් සකස් කරන ලද්දා වූ අටමඟල වීදිය ඉතාමත් සුළු වේලාවක් ඇතුළත එක් තැනැත්තෙකු හෝ දෙදෙනෙකු විසින් කපා සුණු විසුණු කිරීම සිදු කෙරේ. ඒ සඳහා යොදා ගනු ලබන්නේ ද කඩුව නම් වූ මුවහත් ආයුධය යි. මෙකී කඩුව අතට ගන්නා වූ යකැදුරන් බියකරු වෙස් මවා ගනිමින් තාණ්ඩව ගණයෙහි ලා ගැනෙන අංග චලන හා වේග රිද්ම රටාවලින් යුක්ත වූ නැටුමකින් වීදිය කපා දමන බව ජයසේන කෝට්ටේගොඩ දක්වයි (1998).

*''විත කළ ඇදුරු හට කපමින් අලගු ලක් සෙට*
*ඇට සැකිලි වෙන් කොට කපමි අටමගලය එසුන් කොට*

*අරන් කඩුව ඉසවට කර කවන්නේ*
*සැනෙන් ගොසින් විත කළ ඔහු මරන්නේ*
*වරෙන් එවෙස මුණි රජු අණ අසන්නේ*
*කපමි මෙවිත කළ හතුරට වදින්නේ''*

මෙලෙස කවි ගායනාවන් ඉදිරිපත් කරමින් ආතුරයා අටමඟල තුළ සිටිය දී යකැදුරා විසින් වීදිය සුණු විසුණු කොට දමන අතර කඩුව හිස වටා කරකවමින් කොටසින් කොටස වීදිය කපා ඉවත් කරන යකැදුරා අවසාන කොටස ආතුරයාගේ හිසට තබා කපාල යි (කෝට්ටේගොඩ, 1998). මෙසේ අටමඟල වීදිය ආයුධයකින් කපා ඉවත් කිරීම උඩරට හා සබරගමු සම්ප්‍රදායන්හි සූනියම් යාගයේ දී (සබරගමුවේ දී බඹපාද ශාන්තිකර්මයේ දී) සිදු නො වන අතර පහතරට සම්ප්‍රදායට පමණක් විශේෂ වන්නකි (අලුත්ගේ සහ රණවීර, 2024).

මෙම අවස්ථාව සඳහා කඩුව භාවිතයට ගනු ලබන්නේ අටමඟල වීදිය කපා දැමීමේ විනාශකාරී අපේක්ෂාවෙකිනි. ආතුර පාර්ශවය විෂයෙහි විත කටින අයහට දඬුවමක් ලබා දීම සංකේතවත් වන අයුරින් මෙය සිදු කරනු ලබයි. එමඟින් සිදුවන්නේ මනෝ චිකිත්සනයකි. පහර දීම හෝ විනාශ කිරීම යන මුඛ්‍ය අරමුණින් ශාන්තිකර්ම භූමියෙහි කඩුව භාවිත වන බව ඉන් ගම්‍ය වේ.

එසේ ම සූනියම් ශාන්තිකර්මය තුළ කඩුව භාවිත කරන තවත් විශේෂ වූ අවස්ථාවක් වශයෙන් පුහුල කැපීම නම් කළ හැකි වේ. පුහුල කැපීම නැතහොත් පුහුල් තීන්දුව කැපීම නමින් හඳුන්වන මෙය සඳහා අළු පුහුල් ගෙඩියක් යොදා ගනී. මෙම පුහුල කැපීමට පෙර ආතුරයා ලවා තුන්වරක් මුහුණ අත පිස ගැනීමෙන් පසුව සුවඳ දුම් අල්ලා ගන්නා ලද පුහුල එක අතකටත් ඊගස තවත් අතකටත් ගනිමින් පුහුලේ උපත් කවි ගායනා කෙරෙන අතර පුහුල කැපීමට යොදා ගන්නා වූ කඩුව සඳහා ද දිෂ්ටි මන්ත්‍ර ගායනා කෙරේ (මහින්ද කුලසිංහ, සඃ සා, 2021 පෙබරවාරි 18).

මෙසේ ආතුරයා ඉදිරියේ දුම්මල දුම් අල්ලා එළන ලද පැදුරක් මත දිගාවන යකැදුරා ඒ මත සුදු රෙද්දක් ද පොරවාගෙන එයට උඩින් අයිලයක් ද තබා ගනිමින්, පාද මුලට කුකුළා තබා දකුණතට ඒ ගස තබා ඇදුරාගේ පපුව මත තැබූ අළු පුහුල පිහියකින් හෝ කඩුවකින් ආතුරයා ලවා දෙපළු කරවයි (කෝට්ටේගොඩ, 1998). මෙකී පුහුල කැපීම සඳහා ඇතැම් අවස්ථාවන්හි නිවෙස්හි පරිහරණය සඳහා වෙන් කර ඇති කඩු වර්ග ද යොදා ගැනේ (බෙන්තරගේ, 2005). එක පහරින් කැපෙන මුවහතක් කඩුවට තිබීම ද අනිවාර්යය වූවකි. ඇතැම් ස්ථානයන්හි පිහියක් හෝ කැත්තක ආධාරයෙන් පුහුල කැපීම දක්නට ලැබුණ ද ඊට ගැළපෙන ම හා උචිත ම ආයුධය වන්නේ කඩුව ය. කඩුවට දිෂ්ටි මන්ත්‍ර ගායනා කොට සිදු කරන මෙම චාරිත්‍රයෙහි කිසියම් අභිචාරාර්ථයක් අපේක්ෂිත ය. එක් අතකින් කඩුව පූජාවට යෝග්‍ය පූජා භාණ්ඩයක් බවට පත් කිරීම මෙසේ දිෂ්ටි මන්ත්‍ර ගැයීමේ අපේක්ෂාව වන්නට ඇත.

මෙකී පුහුල කැපීම නම් චාරිත්‍රය සූනියම් ශාන්තිකර්මයෙන් බිඳී පැමිණ ගෘහස්ථ අභිචාරකර්මයන්ට ද එකතු වී ඇත. එකී ගෘහස්ථ පුහුල කැපීම ආදී වූ වින කැපීමේ චාරිත්‍ර හා පුද පූජා සඳහා කඩුව නිරන්තරයෙන් භාවිත කරන බවත් එලෙස කඩුව යොදා ගැනීමේ හේතුව වන්නේ වින කැපීමට යොදා ගන්නා පුහුල හෝ වෙනත් පූජා භාණ්ඩ එක සැණින් කපා දැමීමට හැකි මුවහත කඩුව සතු ව පැවතීම යි.

මෙලෙස උඩරට හා පහතරට ශාන්තිකර්ම ද්විත්වයෙහි ම කඩුව නම් වූ ආයුධය දේවායුධයක්, රංග භාණ්ඩයක් හා පූජා භාණ්ඩයක් වශයෙනුත් භාවිත කිරීම දක්නට ලැබේ. උඩරට නර්තන සම්ප්‍රදායට සාපේක්ෂ වශයෙන් පහතරට නර්තන සම්ප්‍රදායයෙහි කඩුව භාවිතය බහුල ය. එයට හේතුව වන්නේ පහතරට නර්තන සම්ප්‍රදායෙහි දේව තොවිල්වලට වඩා යක් තොවිල් බහුල වීම යි.

### 3.4 ශාන්තිකර්ම භූමිය සඳහා කඩු නිර්මාණය.

ශාන්තිකර්ම සඳහා පූජාභාණ්ඩ හෝ රංග භාණ්ඩ වශයෙන් ආයුධ භාවිත කිරීමේ දී ඇතැම් ආයුධ ශාන්තිකර්මයට අවැසි ලෙස නිර්මාණය කරගන්නා අතර සමහර අවස්ථාවන්හී දී ලෝහයෙන් තැනූ මූලික ආයුධ ද ඒ සඳහා භාවිත කෙරේ. රංග භාණ්ඩ වශයෙන් එක් එක් ආයුධ වර්ග යොදා ගැනීමේ අරමුණ වන්නේ රංග කාර්යය පහසු කර ගැනීම, චරිත හඳුන්වා දීම හා චරිත ස්වභාව තීව්‍ර කිරීම මෙන් ම ආශීර්වාදය විවිධාකාරයෙන් මුදුන් පමුණුවා ගැනීමත් ය. පූජා භාණ්ඩයක් වහයෙන් යොදා ගැනීමේ දී අභිචාරාර්ථය අපේක්ෂිත ය.

රංග භාණ්ඩ පහතරට ශාන්තිකර්මවල තරම් ලක්දිව කුමන ශාන්තිකර්මයක භාවිත නො වන බව ජයසේන කොට්ටේගොඩ පවසයි. එසේ ම දැකුම්කලු නිමාවකින් පරිපූර්ණ වන මේවා යකැදුරන් විසින් ස්වාභාවික අමුද්‍රව්‍ය ආශ්‍රයෙන් නිර්මාණය කර ගනී (කෝට්ටේගොඩ, 2013). ස්වාභාවික අමුද්‍රව්‍ය ලෙස කෙසෙල් පතුරු, කෙසෙල් බඩ, ගොක් කොළ, ගොක් අතු, ඉරටු, හබරළ කොළ, හබරළ පිති.... යනාදිය සුවිශේෂ වේ.

ගොප් බිඩංගයක් හෝ පොල් පිත්තක මුල් කොටස ආශ්‍රයෙන් ශාන්තිකර්මවල දී කඩුව නිර්මාණය කරනු ලැබේ. මෙලෙස නිර්මාණය කරගනු ලබන්නේ පහතරට සන්නියකුම නම් ශාන්තිකර්මයේ කළු යකු අතැති ව එන විදුරු කඩුව එසේ නිර්මාණය කර ගත්තකි. එමෙන් ම කෝල සන්නිය හා කඩු පාලිය නැටීමේ දී ද අත්‍යවශ්‍ය රංග භාණ්ඩයක් වශයෙන් කඩුව භාවිත කරයි. එය නිර්මාණය කිරීම සඳහා යොදා ගන්නේ අමු පොල් පිත්තක වක් හැඩය සහිත මුල් කොටසින් අවශ්‍ය දිගින් කපා ගත් පොල් පිති කැබැල්ලකි. කඩුවේ මිට හා තලය මතු කෙරෙන සේ දෙපස කොටස් ඉවත් කර අත් වැස්ම ගොප් පිති හෝ ගොප් කොළ ආශ්‍රයෙන් නිර්මාණය කෙරේ (බෙන්තරගේ, 2005).

ඉපැරණි ශාස්ත්‍ර නියමයන්හි කඩුවේ දිග ප්‍රමාණය අනුව උත්තම, මධ්‍යම, කණිෂ්ඨ යනුවෙන් කොටස් තුනක් පවතී. උත්තම ගණයේ කඩුවෙහි අග පටන් මුල දක්වා අඟල් පනහක් ද කණිෂ්ඨ ගණයේ කඩුව අඟල් විසි පහක් ද ඒ ද්විත්වය අතර යෙදෙන දිග ප්‍රමාණ සහිත කඩු මධ්‍යම ගණයේ කඩු බව ද දක්වා ඇත. ශාන්තිකර්ම සඳහා නිර්මාණය වන්නා වූ කඩුව ලෝහමය ආයුධයක් නො වූවත්, එය නිර්මාණය කරනු ලබන්නේ මධ්‍යම ප්‍රමාණයෙනි (බෙන්තරගේ, 2005).

ස්වාභාවික අමුද්‍රව්‍ය ආශ්‍රය කොට ගනිමින් නිර්මාණය වුව ද ශාන්තිකර්ම පද්‍ය සාහිත්‍යයෙහි දැක්වෙන්නේ විදුරු කඩුව, එරන් කඩුව යන ලෝහවලින් සෑදූ කඩු වර්ගයන්හි නාමයන් ය. කළු යකාට ගයන පහත කවියෙන් එය සනාථ කළ හැකි ය.

*''නපුරු දුජන අවගුන පාමින් යකු බැස මෙනර ලොව ට*
*විදුරු කඩුව ගති එ යකා මෙනර ලොවට ගොඩ බසින ට*
*සොඳුරු ගුණේ නැතිවම යකු වැසෙමින් දුටු අඟනන් හට*
*ඉඳුරු දිගින් වර කළු යකු මෙපුද බලා පිදවිල්ල ට''*

(කෝට්ටේගොඩ, 2009: 47)

කෙසේ වෙතත් ලෝහමය කඩු වර්ග ද යාග භූමියට යොදා ගනී. ඒ පුහුල කැපීම, දිය කැපීම, දේවාභරණ වැඩමවීම ආදී වූ අවස්ථාවන්හි දී ය.

## 4. නිගමන හා නිර්දේශ

ජන සම්ප්‍රදායන් වශයෙන් ගොඩනැගී ඇති දේශීය සංස්කෘතික සන්දර්භයෙහි කඩුව අත දරන්නේ මිනිසුන් පමණක් නොවේ. දෙවියෝ හා යක්ෂයෝ ද විවිධාකාර කඩු දරති. යක්ෂ ලොව, මනු ලොව හා දෙව් ලොවත් ප්‍රසිද්ධ වූ කඩුව නම් ආයුධය ආරක්ෂාව මෙන් ම යුධ කිරීම, රාජාභිෂේකය, වධක කාර්යය, දිවුරුම් දීම, යාතු කර්ම, අභිචාරකර්ම මෙන් ම නර්තනය සඳහා ද උපයෝගී වේ.

උඩරට හා පහතරට ශාන්තිකර්මයන්හි කඩුව හා බැඳුණු පුද පෙළපාළි ප්‍රධාන අවස්ථා කිහිපයක් අරමුණු කොට ගෙන භාවිත කරන බව අධ්‍යයනයේ දී අනාවරණය විය.

1. දේවාභරණයක් වශයෙන්
2. යක්ෂයන්ගේ අත දරන ආයුධයක් වශයෙන්
3. නර්තනාංගවලට අයත් රංග භාණ්ඩයක් වශයෙන්
4. වින කැපීම් වස් දොස් දුරු කිරීම් සඳහා උපකරණයක් වශයෙන්

ශාන්තිකර්මයක් යනු අභිචාරාත්මක බලයෙන් ආතුර මනසට ශාන්තියක් අත්කර දෙන ගුප්ත විද්‍යාත්මක ක්‍රියාවලියකි. ශාන්තිකර්මයක දී යොදා ගන්නා සෑම භෞතික වස්තුවක් ම ආතුරයාට ශාන්තිය ලබා දීම අරමුණු කොට පවතී. රංග භාණ්ඩ හෝ පූජා භාණ්ඩ වශයෙන් යොදා ගන්නා සියලු දේ යාතුකර්මයේ අභිමතාර්ථ සාධනය අපේක්ෂිත ය.

කඩුව පූජා භාණ්ඩයක් ලෙස ශාන්තිකර්ම භූමියේ දී පූජාර්ථයෙන් භාවිත කරන ප්‍රධාන අවස්ථාවක් වන්නේ දේවාභරණයක් සේ යාග භූමිය තුළ පුද ලැබීම යි. දෙවියන් ජීවමාන ව වැඩමවිය නො හැකි එහෙත් ජීවමාන යැයි ආතුරයාට සන්නිවේදනය කිරීම සඳහා ශාන්තිකර්ම භූමියට දෙවිවරුන් සංකේතවත් කරමින් කඩුව ද වැඩමවනු ලැබේ. දේශීය වශයෙන් විවිධ දේව සංකල්ප ගොඩනැඟීමේ දී එකී දේවත්වයේ බලය හා ගුඪත්වය තීව්‍ර කරනු වස් දෙවියන්ගේ අතට ආයුධ වශයෙන් කඩුව ලබා දෙන්නේ එකී දෙවියාගේ රණශූරත්වය, වීරත්වය හෝ තේජස මතුකරලනු සඳහා ය. සූනියම් හෙවත් ගම්භාර දෙවියන්, කතරගම දෙවියන්, දැඩිමුණ්ඩ දෙවියන් හා බණ්ඩාර දෙවිවරුන් මෙන් ම වීරමුණ්ඩ දෙවියන් ද සංකේතවත් කරමින් කඩුව දේවාභරණ අතරට එක් වෙයි.

මිනිසුන්ට වින පමුණුවන, මිනිසුන් ලෙඩ කරවන යකුන් දේශීය ජන සම්ප්‍රදායයෙහි සුලබ ය. වින පැමිණ වූ යක්ෂයා ම නැවත සෙත් කොට පිට ව යාම ශාන්තිකර්ම පෙළපාළිවල මූලික සැකැස්මකි. යක්ෂයින්ගේ පැමිණි දෝෂ සඳහා මනෝ චිකිත්සනය සිදු කරන්නේ එපරිද්දෙනි. කඩුව අත දැරූ යක්ෂයෝ ශාන්තිකර්මයන්හි කිහිප දෙනෙක් වෙති. කළු යකා හා සූනියම් යකා ඒ අතර සුවිශේෂ ය. යක්ෂයන්ගේ අත දරන ආයුධයක් වශයෙන් කඩුව භාවිත කරන අවස්ථා උඩරට සම්ප්‍රදායට වඩා පහතරට සම්ප්‍රදායේ සුලබ බව අධ්‍යයනයෙන් අනාවරණය විය.

කඩුව යන ආයුධයේ ප්‍රධාන කාර්යය වන කැපීම හා කෙටීම නිරූපණය කිරීම ද ශාන්තිකර්මයක් තුළ සිදු වේ. උක්ත ක්‍රියාවලි අනුකරණය කොට දැක්වීමට මෙන් ම සංකේතාත්මක ව නිරූපණය කිරීමට ද කඩුව යොදා ගනී. මරා ඉපැද්දීම, මරු සන්නිය, කඩු පාළිය මෙන් ම කළු යකා ද කඩුවෙහි උක්ත කාර්යය සිද්ධ කරයි. නර්තනාංගවලට අයත් රංග භාණ්ඩයක් වශයෙන් එලෙස භාවිත වන කඩුව අභිචාරාර්ථය මෙන් ම සංකේතාර්ථය ද ජනිත කරවයි. කෙසේ වෙතත් කඩු පාළිය හා කළු යකා වැනි නර්තන පෙළපාළිවල දී කඩුවෙන් ජනිත කෙරෙන භයානක රසය ක්‍රමයෙන් හීනවන ආකාරයෙන් නර්තන වින්‍යාසය ගොඩ නඟා තිබේ. එය ද මනෝ චිකිත්සනයේ ප්‍රධාන කාර්යාවලියකි.

වින කිරීම් හා වින කැපීම් සඳහා ද කඩුව ආයුධයක් වශයෙන් භාවිත වේ. කඩුවෙන් සිදු කරන අජීවී වස්තූන් කපා දැමීම මත කිසිදු ජීවී වස්තුවකට හානි නො වන බවත් දෙවියන් මුල් කොට ගත් ශාන්තිකර්මයනට වඩා වැඩි වශයෙන් යක්ෂයින් මුල් කොට ගත් ශාන්තිකර්මයන්හි උක්තාර්ථයෙන් කඩුව භාවිත වන බවත් ප්‍රකට විය. එසේ වීමට හේතුව වින කිරීම් හා වින කැපීම් යන ද්විත්ව කාර්යය ම යකුන් මුල් කොට ගෙන පවත්වනු ලබන හෙයිනි.

ශාන්තිකර්ම භූමියට කඩුව යනු හුදු රංග භාණ්ඩයක් පමණක් ම නොවේ. අභිප්‍රේතාර්ථ රැසක් මූලික කොට ගත්තකි. කැපීම හා කෙටීම වැනි කඩුවෙහි මුඛ්‍යාර්ථ මතු කිරීම, එවන් අවස්ථා මතු කරලමින් අභිචාරාත්මක කාර්යයන් සිදු කිරීම, දෙවියන් හෝ යක්ෂයින් සංකේතවත් කිරීම වැනි අවස්ථා සඳහා ස්වාභාවික අමුද්‍රව්‍ය භාවිත කඩු මෙන් ම ලෝහමය කඩු ද ශාන්තිකර්මයන්හි භාවිත වේ. රංග භාණ්ඩයක් හෝ පූජා භාණ්ඩයක් ලෙස ශාන්තිකර්මයන්හි කඩුව භාවිත කිරීමේ දී කඩුව නම් ආයුධයට අදාළ මූලික භාවිතාර්ථ හා ස්වරූප තත්ත්වාකාරයෙන් නිරූපණය වන බවත් සංකේතාර්ථය හෝ අභිචාරාර්ථය ප්‍රමුඛ කොට ගනිමින් ආතුර මනසට විශ්‍රාන්තියක් ලබා දීමට හැකි වස්තුවක් බවත් අධ්‍යයනයෙන් අනාවරණය විය.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


ආරියදාස, අනූෂා. (2018). *පුරාණ ඇදහීම් හා ශාන්තිකර්ම.* වාසනා ප්‍රකාශකයෝ.

අලුත්ගේ, ඒ. ඩී. එච්. පී. සහ රණවීර, ඩබ්ලිව්. වී. පී. එච්. (2024). *උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායයන්හි සූනියම් ශාන්තිකර්මයේ අටමඟල භාවිතය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්.* විද්‍යෝදය මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා සඟරාව, 09 (01). ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. https://journals.sjp.ac.lk/index.php/vjhss/issue/view/340

උදයංගනී, අයි. පී. එන්. (2020). *උඩරට රාජධානි සමයේ ආරක්ෂාවට යොදාගත් පැරණි සටන් ක්‍රම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.* ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

කාරියවසම්, තිස්ස. (1976). *ශාන්තිකර්ම හා සිංහල සමාජය.* ප්‍රදීප ප්‍රකාශකයෝ.

කුලතුංග, ටී. ජී. (2000). *මධ්‍යකාලීන ශ්‍රී ලංකාවේ ආරක්ෂක සංවිධාන.* ඇස් ගොඩගේ හා සහෝදරයෝ.

කෝට්ටේගොඩ, ජයසේන. (2013). *පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය.* ජේ. කේ. පබ්ලිකේෂන්.

කෝට්ටේගොඩ, ජයසේන. (1998). *මැණික්පාල ශාන්තිය හෙවත් සූනියම් කැපිල්ල.* ලස්සන මුද්‍රණ ශිල්පීන්.

කෝට්ටේගොඩ, ජයසේන. (2009). *ප්‍රායෝගික පහතරට නර්තනය 1.* ජේ. කේ. පබ්ලිකේෂන්.

ජයතිස්ස, ගුණපාල. (2011). *රට සහ රජු රැකි රණ අවි.* https://www.divaina.com/2011/09/19/mano01.html

දිසානායක, මුදියන්සේ. (1996). *දෙමළ හත් පත්තුවේ ඇදහිලි විශ්වාස හා ශාන්තිකර්ම.* චතුර මුද්‍රණාලය.

දිසානායක, මුදියන්සේ. (2001). *නර්තන වාක් කෝෂය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, මුදියන්සේ. (2010). *සිංහල නර්තන කලාව.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, මුදියන්සේ. (2016). *කොහොඹා යක් කංකාරිය සහ සමාජය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, මුදියන්සේ. (2020). *ව්‍යවහාරික උඩරට නර්තන කලාව.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ සමාගම.

පීරිස්, ඥානසිරි. (2009). *ශාන්තිකර්ම හා අභිචාර විධි.* වාසනා ප්‍රකාශකයෝ.

බෙන්තරගේ, ලයනල්. (2005). *පහතරට ශාන්තිකර්මවල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ.* කර්තෘ ප්‍රකාශනයකි.

විමලානන්ද, ටී. (1962). *උඩරට මහ කැරැල්ල.* ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

සමරසේකර, සුමනපාල. (1995). *තොවිල්.* ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

සෝමරත්න, ඩබ්. ආර්. පී. (1963). *සිංහල ජාතික ක්‍රීඩා.* ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

හේරත්, එම්. එම්. අයි. (2011). *ඉපැරණි සිංහල අවි ආයුධ සහ සන්නාහ ක්‍රම.* දිවයින at:https://www.divaina.com/2011/09/07/badada02.html

Burton, S. R. F. (1884). *The Book of the Sword*. In *Google Books*. Chatto and Windus. https://books.google.lk/books?id=PgYHAAAAQAAJ

Lee, M. (2012). The Sword: The Development of Consciousness. *Journal of Symbols & Sandplay Therapy*, *3*(2), 45–65. https://doi.org/10.12964/jsst120013

Malborg, K., & Lee Jean Young. (2005). *Korean dance*. Ewha Womans University Press.